**මැදදුම්බර ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**----------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 26 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**---------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-------------------------------------------------**

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය වෙනුවෙන් දරා තිබූ රු.3,014,373 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ හා මුද්දර ගාස්තු උපචිත පදනමට ගිණුම්ගත නොකර ලැබූ මුදල රු.2,128,534 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර රු.1,218,714 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි අයිතම 5 ක වටිනාකම තක්සේරු කර ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි 10 න් 5 ක් ප්‍රාග්ධනිත කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ ණයහිමි ලෙජර් ගිණුම හා උපලේඛන අතර රු.278,302 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසර 1-5 අතර කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.41,313,567 ක් හා වසර 5 කට වඩා වැඩි ශේෂවල වටිනාකම රු.14,483,500 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | වසර 1 - 5 ත් අතර ගෙවිය යුතු ශේෂ එකතුව රු.29,036,980 ක් වූ අතර, වසර 5 කට වඩා වැඩි ශේෂයන්හි එකතුව රු.13,076,357 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.35,728,634 ක් වූ ගිණුම් විෂයයන් 8 කට අදාළව ස්ථාවර වත්කම් ලේඛන, තැන්පත් ලේඛන, උපලේඛන, ශේෂ සනාථ කිරීම් යනාදී සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි. |

## 1.4 අනුකූල නොවීම

---------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 149 වගන්තිය | සභා බල ප්‍රදේශයේ හෝටල් 9 කින් සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කළ ගිණුම් ප්‍රකාශන ලබා නොගෙන ආදායම් ප්‍රකාශයක් මත රු.1,648,569 ක මුදලක් ලබාගෙන තිබුණි. | සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කරන ගිණුම් මත ගාස්තු අයකළ යුතුවේ. | හෝටල් 11 කට තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලීම් කළද, එවා ඇත්තේ හෝටල් 3 ක තොරතුරු පමණක් බව දන්වමි. |
| | (ii) 154 (1) වගන්තිය | පිඹුරු අංක 1230 ඉඩමේ කොටස් විකිණීම සඳහා සභාවේ අනුමැතිය නොතිබූ අතර බදු මුදල් ද අයකර නොතිබුණි. | විකුණුම් ආදායම මත බදු මුදල් අයකළ යුතුවේ. | අනුමැතිය ලබා ගැනීමට තොරතුරු ඉදිරිපත් කර ඇති අතර එම පිඹුර අනුමත කළ පසු ගාස්තු අයකරන බව දන්වමි. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තා ඉදිරිපත් කළ යුතු වීම. | පිළිගනිමි. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) (ඊ) වගන්තිය හා 2016 දෙසැම්බර් 13 දින ප්‍රකාශයට පත්කරන ලද ගැසට් පත්‍රය | දැන්වීම් පුවරු 40 කින් රු.46,689 ක ගාස්තුවක් අයකර නොතිබුණි. | වර්ෂය ආරම්භයේ සමීක්ෂණය කර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැන්වීම් පුවරු ගාස්තු ගෙවා නොමැති ආයතනවලට ගාස්තු ගෙවන ලෙස දැනුම් දී ඇත. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 (4) | JCB යන්ත්‍රයට අවස්ථා 4 කදී සිදුවූ රු.157,089 ක් වූ අනතුරුවලට අදාළව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | රක්ෂණයෙන් සියයට 75 ක් පමණක් ආවරණ වී ඇති අතර, වන්දි නොගෙවීම සම්බන්ධව රක්ෂණ ඔම්බුඩ්ස්මන් දැනුවත් කර ලිපි යවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | අංක එන්පී/ ආර්ටීසී /ටීආර්/ සීඑම්/12/07 හා 2012 සැප්තැම්බර් 5 දිනැති ත්‍රී රෝද රථ සේවාව නියාමනය කිරීම සඳහා වැඩපිළිවෙළක් හඳුන්වා දීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය | ප්‍රාදේශීය සභාව විසින් ත්‍රීරෝද රථ නැවතුම්පල 26 ක් පවත්වාගෙන ත්‍රීරෝද රථ 497 ක් ලියාපදිංචි කර තිබුණද, රු.1,884,375 ක බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | ත්‍රීරෝද රථ සේවාව විධිමත්ව නියාමනය කර ගාස්තු අය කළ යුතු වේ. | ත්‍රීරෝද රථ කමිටුවක් සකසා විධිමත් කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4:1 පරිච්ඡේදය | කසළ බඳුන් මිලදී ගැනීමට මිල කැඳවීම් නොකළ ආයතනයකින් මිලදීගෙන රු.190,500 ක් වැයකර තිබුණි. | ප්‍රසම්පාදන නීති, රීති අනුව කටයුතු කළ යුතු වේ. | මිලදීගත් ආයතනය වෙළඳපලේ පවතින මිලට වඩා අඩුවෙන් සපයා ඇත. |

## 1.5 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට පැවත එන රු.24,082 ක් වූ එකතු කළ අගය මත බදු මුදල නිරවුල් කර නොතිබුණි. | එකතු කළ අගය මත බදු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගන්නා බවත් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,989,546 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,383,727 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණු රු.160,728 ක අත්තිකාරම් ශේෂය සහ රු.400 ක අගරු චෙක් වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගන්නා අතර, ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,647,080 | 3,930,546 | 3,044,037 | 2,238,750 | 3,615,024 | 3,693,815 | 4,533,420 | 2,734,289 |
| (ii) | කුලී | 3,124,150 | 3,241,488 | 2,590,792 | 2,373,783 | 2,337,626 | 2,598,674 | 3,327,988 | 1,896,747 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,167,870 | 3,435,463 | 3,433,463 | 16,500 | 3,073,600 | 3,141,886 | 3,076,836 | 3,079,836 |
| (iv) | වෙනත් ආදායම් | 31,526,314 | 31,526,314 | 1,660,583 | 30,863,252 | 474,100 | 549,600 | 610,580 | 750,630 |
| | | 41,465,414 | 42,133,811 | 10,728,875 | 35,492,285 | 9,500,350 | 9,983,975 | 11,548,824 | 8,461,502 |

### 2.3.2 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර වලින් මාස 03 සිට අවු.7 ක් දක්වා රු.1,119,609 ක කඩ කුලී අය කර ගෙන නොතිබුණි. බදුකරුවන් තිදෙනෙකුට රු.333,924 ක මුදලක් අයකර ගැනීමට නඩු පවරා තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | අවුරුදු 2 සිට අවුරුදු 10 ක් දක්වා රු.177,273 ක බිම් කුලී මුදලක් හිඟව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ඇ) | සභාව සතු වත්කම් බදු දීමෙන් 2004 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයකර ගැනීමට පවතින හිඟ බදු කුලී රු.1,081,396 ක් විය. | මෙම ශේෂ සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාමාර්ගයක් ගෙන විගණනයට වාර්තා කළ යුතුවේ. | ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.3.3** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙළින් රු.2,054,651 ක් හා රු.28,470,519 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 19 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගත හැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගත යුතු වේ. | පිළිගනිමි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2014 වර්ෂයේ පුරනැගුම ප්‍රතිපාදන මඟින් රු.7,757,342 ක් වැයකර ඉදිකළ උඩිස්පත්තුව පොළ ගොඩනැගිල්ලේ පහළ මහල නිෂ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරු කර ටෙන්ඩර් කැඳවීමට කටයුතු කළද කිසිදු ටෙන්ඩරයක් ඉදිරිපත් නොවූ බව දන්වමි. |
| (ii) | රු.8,205,546 ක් වැයකර දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණ ද, අපේක්ෂිත අරමුණු හා ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගන්නා බවත් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කළ රු.1,050,718 ක් වටිනා කර්තව්‍යයන් 3 ක් ඉටුකර නොතිබුණි. | ප්‍රතිපාදිත කර්තව්‍යයන් ඉටුකළ යුතුවේ. | කර්තව්‍යයන් 7 ක වැඩ අවසන් කර ඇත. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුළ දෛනිකව කසළ ටොන් 4 ක් පමණ ජනනය වුවත් විධිමත් කසළ කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණ අතර, නොදිරන කසළ ටොන් 1 ප්‍රමාණය ප්‍රධාන වශයෙන් ස්ථාන 03 කට පරිසරයට හානිවන අයුරින් අවිධිමත් ලෙස බැහැර කර තිබුණි. | පරිසරයට හානි නොවන ලෙස කසළ කළමනාකරණය කළ යුතු වේ. | උඩිස්පත්තුවේ කසළ වර්ග කර නොදිරන කසළ, කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ තැම්පත් කර, මැදදුම්බර නගරයේ කසළ වෙන්කර ලබාගෙන දිරන කසළ අලුත්වත්ත කොම්පොස්ට් අංගනයට ලබාදෙන බව දන්වමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ප්‍රමාණවත් අයුරින් හඳුනාගෙන නොමැති අතර, එම නිසා ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | තෙල්දෙණිය බස් නැවතුම්පල ඉදිකර ඇති ගොඩනැගිල්ලේ බදු දීමට තිබූ කඩ කාමරය තාවකාලිකව තෙල්දෙණිය ඩිපෝවේ සේවකයින්ගේ විවේක කාමරය ලෙස භාවිතා කිරීමට ඉඩදී තිබීම හේතුවෙන් සභාවට 2019 වර්ෂයේදී රු.501,500 ක ආදායමක් අහිමිවී තිබුණි. | සභාව සතු වත්කම් සභාවේ කටයුතු සඳහා පමණක් යොදාගත යුතු වේ | මෙම කඩ කාමරය ලබා ගැනීමට තෙල්දෙණිය ඩිපෝව වෙත ලිපි යොමුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තෙල්දෙණිය නගරයේ ඉදිකිරීමට යෝජිත පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර වෙනුවෙන් බදුකරුවන් එක්වන් මුදල් ලෙස රු.27,600,000 ක් තැන්පත් කර තිබුණි. කඩ කාමර වෙන් කිරීමේ ගැටළුවක් නිසා බදුකරුවන් 22 නෙකු විසින් සභාවට විරුද්ධව නඩු පැවරීම හේතුවෙන් 2019 සැප්තැම්බර් 30 දින වන විට රු.1,051,600 ක මුදලක් නීතිඥ ගාස්තු දැරීමට සිදුවී තිබුණි. | යෝජිත වෙළඳ සංකීර්ණය ඉදිකර බදුකරුවන්ට කඩ ලබාදීමට කටයුතු කළ යුතු වේ. | නඩු 21 න් නඩු 8 ක් නීතිඥ ගාස්තුවලට යටත්ව නිෂ්ප්‍රභා වූ අතර, වාරන නියෝගයක් පවතින බැවින් ඉදිකිරීම් කඩිනම් කිරීමට නොහැකි වී ඇති බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 16 ක් විය. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සේවක ණය<br>ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 22 දෙනෙකුගෙන් වර්ෂ 1 සිට 18 ක් දක්වා කාලයකට අයත් රු.1,695,507 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වර්තමානය වන විට ශේෂය අඩු වී ඇති බව දන්වමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ ජල ව්‍යාපෘතිවල ජලමනු සවි නොකර පාරිභෝගිකයින් 191 දෙනෙකුගෙන් මසකට රු.200 ක් හා 500 ක ස්ථාවර ගාස්තුවක් අයකර තිබුණි. | ජලමනු සවිකර ජල පාරිභෝගිකයන්ගෙන් ආදායම් ලබා ගැනීමට කටයුතු කිරීම. | ජලමනු සවි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | උඩිස්පත්තුව පොළ ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ කඩ කාමර 2 ක් බදු දීමට කටයුතු කර නොතිබුණු බැවින් රු.328,000 ක ආදායමක් අහිමිවී තිබුණි. | ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරුවක් ලබාගෙන ටෙන්ඩර් කළද, කිසිදු ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් නොවූ බැවින් තෙවන වරටත් ටෙන්ඩර් කැඳවීමට නියමිත බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තෙල්දෙණිය නගරයේ සභාව සතු ඉඩම් 8 ක් තක්සේරුවක් නොමැතිව 2009 වර්ෂයේ සිට රු.300 ක බිම් කුලියක් අයකර බදු දී තිබුණි. | තක්සේරු කර බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ඉඩම් තක්සේරු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇති බව දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රු.24,928,666 ක් වටිනා මෝටර් ග්‍රේඩරයෙන් 2019 වර්ෂයේ ආදායමක් ලබා නොගෙන කාර්යාල භූමියේ නිෂ්කාර්යව දමා තිබුණි. | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.5.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.600,000 ක් වටිනා ජීප් රථයක් වසර 5 කට වැඩි කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ට්‍රැක්ටරයක් හා ට්‍රේලරයක් භාවිතයෙන් ඉවත් කර තිබුණ ද ඒ පිළිබඳව නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට කටයුතු කිරීම. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.5.3 වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු ටිපර් රථය හා ෆෝටෝන් ලොරි රථය ඌන උපයෝජිතව පැවතුණි. | වත්කම්වලින් ආදායම් ඉපයීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ට්‍රේලරයක් ට්‍රැක්ටරයක් නොමැති වීම හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර තිබුණි. | මෙම ට්‍රේලරය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.6 ප්‍රසම්පාදනය**

**-----------------**

**ප්‍රසම්පාදන සැලැස්ම**

**--------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------ | ------------------------------ |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. |